**බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ (PL-03) තනතුරු වලට අදාළ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත) සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය - 2020**

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ (PL -03) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි කාර්මික, විද්‍යුත් වෛද්‍ය යාන්ත්‍රික, සෞඛ්‍ය රියදුරු යන තනතුරු සඳහා අදාළ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020 වර්ෂය සඳහා පළමුවරට පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. සුදුසුකම්

මෙම විභාගයට අයදුම්කල හැක්කේ PL -03 තනතුරේ II ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති මෙතෙක් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තවද අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2021.01.22 වේ.

03. අයදුම්පත්

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් 2021.01.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය. ඒ සමඟ අදාළ තනතුරේ II ශ්‍රේණියට පත්කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් ද එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. ආදර්ශ අයදුම්පතෙහි ආකෘතිය අනුව, අයදුම්පත්‍රය එකම කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 10 දක්වාත් දෙවන පිටුවේ අංක 11 සිට 14 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

05. විෂයය නිර්දේශය
ලිඛිත පරීක්ෂණයකි.

(අ) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි කාර්මික, විද්‍යුත් වෛද්‍ය යාන්ත්‍රික

| ප්‍රශ්ණ පත්‍රය | විෂය නිර්දේශය | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් මූල්‍ය රීති | i. ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද<br>• ආරක්ෂක ඇඳුම් හා නිලඇඳුම් ( පරිච්ඡේද අංක XXI)<br>• සුභ සාධක පහසුකම් (පරිච්ඡේද අංක XXII)<br>• ඇතැම් වර්ග වල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිළධාරීන් විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි (පරිච්ඡේද අංක XXIII)<br>• වැටුප් ණය සහ අත්තිකාරම් (පරිච්ඡේද අංක XXIV)<br><br>ii. බස්නාහිර පළාත් මූල්‍ය රීති 72 හා 82<br>(ප්‍රශ්න 7 කි. ප්‍රශ්න 04 කට පිළිතුරු ලිවීම අවශ්‍යයි.) | පැය 1 ½ | 40 |

(ආ) සෞඛ්‍ය රියදුරු

| ප්‍රශ්ණ පත්‍රය | විෂය නිර්දේශය | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මූල්‍ය රීති හා මූලික ප්‍රථමාධාර | i. ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 01 සිට 04 දක්වා<br>ii. බස්නාහිර පළාත් මූල්‍ය රීති 58,59,60,68,72 හා 82<br>iii. ගිලන් රථ රෝගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලබා දුන් පුහුණුව ආශ්‍රයෙන්<br>(ප්‍රශ්න 07 කි. ප්‍රශ්න 04 කට පිළිතුරු ලිවීම අවශ්‍යයි.) | පැය 1 | 40 |

06. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

මෙම විභාගය සම්බන්ධව බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය.

07. මෙම තොරතුරු බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය. www.healthmin.wp.gov.lk

මෙම විභාග නිවේදනය සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එච්.ජී.ජී.ජේ. ධර්මසේන
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
හා සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)

**එච්. ජී. ජී. ජේ. ධර්මසේන**
**ලේකම්**
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත